**ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - 2024**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා අග්නිදිග නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ තොරතුරුවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධවපරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදීවෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මග හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- විශ්වවිද්‍යාලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සහ

- විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 07 හි 47 වන ඡේදය ප්‍රකාරව, දේපල, පිරියත සහ උපකරණවල සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම සෑම වසර තුනකට හෝ පහකට වරක් නැවත ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතු අතර විශ්වවිද්‍යාලයේ ඉඩම 2011 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ඇති අතර එහි වටිනාකම රු.450,330,000 ක් විය. ඉන් පසු නැවත ප්‍රත්‍යාගණයක් සිදු කර නොතිබුණි. | ඔළුවිල්, සමන්තුරෙයි සහ මල්වත්ත පරිශ්‍රයන්හි ගොඩනැගිලි සහ ආකෘතීන් විස්තර සහිතව වත්කම් නැවත තක්සේරු කිරීම සඳහා 2023.10.16 දිනැති ලිපියක් මඩකලපුව ප්‍රාදේශීය තක්සේරුකරු වෙත යවන ලදී. පසුව දිස්ත්‍රික් තක්සේරුකරු විසින් ගිවිසුම් සහිතව තක්සේරු ගාස්තුව රු.මිලියන 9.0 ක් පමණ වන බව දැනුම් දෙන ලදී. වර්තමාන මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් විශ්වවිද්‍යාලයට මෙය ගෙවිය නොහැකි නමුත් අනාගතයේදී කාර්යය සම්පූර්ණ කිරීම සඳහා අරමුදල් වෙන් කිරීමට සැලසුම් කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 නොවැම්බර් 01 දින බැඳුම්කර කාලය අවසන් වූ පරිවාස කාලයේ සිටින කථිකාචාර්යවරයෙකුගෙන් ලැබිය යුතු රු.5,002,095 ක බැඳුම්කරය, 2023 සහ 2024 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත වටිනාකමින් ලැබිය යුතු දෑ අඩුවෙන් දක්වා තිබුණි. | වසර 8ක් ඇතුළත පශ්චාත් උපාධි උපාධිය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් සේවයෙන් පහ කරන ලද කථිකාචාර්යවරයා, COVID-19 සහන පිරිනමන 2024.03.18 දිනැති අංක UGC/HR/2/3/106/Lec දරන චක්‍රලේඛය යටතේ නැවත සේවයට පැමිණීමට අපේක්ෂා කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කැබිනට් අනුමැතිය ඉල්ලා ඇති අතර, අවසන් තීරණය ගත් පසු ඔහුගේ බැඳුම්කර වටිනාකම හඳුනාගනු ලැබේ. | බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට තීරණය කළ වහාම, ලැබිය යුතු දෑ ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | AHEAD ව්‍යාපෘතිය යටතේ රු.41,523,530 ක ප්‍රදානයකින් ව්‍යාපෘති කාල සීමාව තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් හය දෙනෙකු ඔවුන්ගේ ආචාර්ය උපාධි වැඩසටහන් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් යටතේ මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස මෙම මුදල ප්‍රාග්ධනීකරණය කර නොතිබුණි. | එය ප්‍රාග්ධනිත කර 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ. | අස්පෘශ්‍ය වත්කම් යටතේ මානව ප්‍රාග්ධනයක් ලෙස ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතුය. |

**1.6 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගිය නිලධාරීන් නව දෙනෙකුගෙන් ණය, අත්තිකාරම් සහ වැටුප් වශයෙන් රු.2,006,843 ක මුළු මුදලක් අයකර නොගෙන තිබුණි. මෙම මුදල් වසර 2 සිට 24 දක්වා කාල පරිච්ඡේදයක් හිඟව පැවතුණි. | ආයතන අංශය විසින් අදාළ පුද්ගලයින් වෙත දැනටමත් ලිපි යවා ඇති අතර සමහරක් සඳහා නීතිමය කටයුතු සිදුවෙමින් පවතී. | ලැබිය යුතු ගිණුම් එකතු කිරීම සඳහා කාලීනව පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ අංක 04/2019 හා 2019 ජූලි 19 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 1 වන වගන්තිය. | 2024 දෙසැම්බර් 31 දිනට එකතුව රු.86,454,652 ක්වූ ස්ථාවර තැන්පතු 05 ක කෙටිකාලීන ආයෝජනය කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය සහ අනුමැතියද සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියද ලබාගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් 2024–2025 වර්ෂවල ස්ථාවර තැන්පතු වල ආයෝජනය සඳහා UGC හරහා අනුමැතිය ඉල්ලා සිටියද, තවමත් අනුමැතිය ලැබීමට නියමිත බැවින්, රු.මිලියන 23 ක පමණ පොලියක් අහිමි වීම වැළැක්වීම සඳහා ආයෝජනය කිරීමට කටයුතු කරන ලදී. | ස්ථාවර තැන්පතුවල අවශ්‍ය පරිදි ආයෝජන කිරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) **2018 අංක 19 දරන ජාතික විගණන පනත** | | | |
| (i) 38(1) (ඇ) සහ 38(2) වගන්ති | විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සංවර්ධනය කර පවත්වාගෙන යා යුතු අතර, එහි කාර්යක්ෂමතාව වරින් වර සමාලෝචනය කළ යුතු අතර එම සමාලෝචනයට අදාළ විස්තර විගණකාධිපතිවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු වුවද, එසේ සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර පාලනයන් සක්‍රීයව ක්‍රියාත්මක කරන ලද අතර, සියලුම වවුචර් උපකුලපතිවරයාගේ උපදෙස් පරිදි පූර්ව විගණනය කරන ලදී. 2024 දී විගණන විමසුම් 14 ක් ලැබී පිළිතුරු ඉදිරිපත් කරන ලද අතර, ස්වයං-මූල්‍ය කටයුතු අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර ලිපියක් නිකුත් කරන ලදී. | විනිවිදභාවය සහ අනුකූලතාවය සහතික කිරීම සඳහා එම සමාලෝචන වාර්තා විගණකාධිපතිවරයා වෙත විධිමත් ලෙස ලිඛිතව ඉදිරිපත් කළ යුතුය. |
| (ii) 38(1) (ඉ) වගන්තිය | සමාලෝචිත වර්ෂයට අදාළව 2025 මැයි 31 දක්වා විගණන විමසුම් 14 නිකුත් කරන ලද අතර ඒ සඳහා දින 47 සිට 135 දක්වා ප්‍රමාදයකින් පිළිතුරු ලැබී තිබුණි. | අනාගතයේදී කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කරන බවට විශ්වවිද්‍යාලය සහතික වී ඇත. | විගණන විමසුම් සඳහා කාලීනව ප්‍රතිචාර සහතික කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මුදල් රෙගුලාසි (මු.රෙ.).** | | | |
| (i) මු.රෙ. 103(1) | 2024 වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව, විශ්වවිද්‍යාලයේ විවිධ අංශ හරහා සත්‍යාපනය නොකළ, සොයාගත නොහැකි, ඌන, මාරු කළ, නොලැබුණු සහ අතිරික්ත අයිතම වැනි විවිධ කාණ්ඩ යටතේ මුළු අයිතම 538 ක් වාර්තා විය. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම අයිතම සත්‍යාපනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, සැසඳුම් වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ. | සමීක්ෂණ මණ්ඩල වාර්තා සමාලෝචනය කර මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිවිධාන සකස් කිරීමට පියවර ගත යුතුය. |
| (ii) මු.රෙ.1645 (ආ) සහ මු.රෙ. 1647 (අ) | වාහන 18 කට අදාළ වාහන ධාවන සටහන් වල මාසික සාරාංශ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | වාහන ධාවන සටහනේ පරිගණකගත මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ධාවන සටහන් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3 (1) වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 10/2017 | විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් තහවුරු කළ යුතුය. කෙසේ වෙතත්, තාවකාලික කථිකාචාර්යවරුන් 102 දෙනෙකු ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම සහ පිටවීම තහවුරු කර තිබුණද, ස්ථිර කථිකාචාර්යවරුන් 211 දෙනෙකු, පුස්තකාල නිලධාරීන් 05 දෙනෙකු සහ බාහිර කථිකාචාර්යවරුන් 44 දෙනෙකු ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම සහ පිටවීම තහවුරු කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ, පැමිණීමේ අධීක්ෂණය කාර්ය මණ්ඩල කාණ්ඩය අනුව වෙනස් වේ. පුස්තකාල නිලධාරීන් සහ බාහිර කථිකාචාර්යවරුන් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කිරීම වෙනුවට නම්‍යශීලී කාලසටහන් අනුගමනය කරන අතර සහතික කළ පැමිණීමේ වාර්තා ඉදිරිපත් කරන අතර තාවකාලික කථිකාචාර්යවරුන් නිතිපතා වැඩ කරන අතර ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කරයි. මෙම විධිවිධානය එක් එක් භූමිකාවේ ස්වභාවයට ගැලපෙන අතර ඵලදායී රාජකාරි අධීක්ෂණයක් සහතික කරයි. | ආයතන සංග්‍රහයට සහ චක්‍රලේඛයට අනුකූල විය යුතුය. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016. | ඉන්ධන පරිභෝජන පරීක්ෂණ සෑම මාස 12 කට වරක්, සෑම කිලෝමීටර 25,000 කට වරක් හෝ ප්‍රධාන එන්ජින් අලුත්වැඩියාවකින් පසුව පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, විශ්ව විද්‍යාලය වාහන 25 ක් සඳහා මෙම පරීක්ෂණ පවත්වා නොතිබූ අතර, ඒවායේ කාල පරතරයන් අවුරුදු 3 සිට 10 දක්වා විය. | පාස්කු ප්‍රහාර, COVID-19 සීමාවන්, ආර්ථික හා ඉන්ධන අර්බුදය සහ ඉහළ ගිය නිල සහ ක්ෂේත්‍ර චාරිකා අවශ්‍යතා හේතුවෙන් විශ්වවිද්‍යාලයේ වාහන සඳහා සූදානම් කළ ඉන්ධන පරිභෝජන පරීක්ෂාවන් නියමිත කාලයේදී සිදු කිරීමට නොහැකි විය. | චක්‍රලේඛයට අනුකූලව වාහන සඳහා ඉන්ධන පරිභෝජන පරීක්ෂණ නිතිපතා පැවැත්විය යුතුය. |
| (ඊ) **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ** | | | |
| (i) අංක 15/2015 හා 2015 නොවැම්බර් 17 දිනැති ආයතන චක්‍රලේඛය | අභ්‍යන්තර සිසුන් සහ බාහිර සිසුන් සඳහා පවත්වන ලද විභාගවල ප්‍රතිඵල මාස 03 ක් ඇතුළත නිකුත් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 වර්ෂයේ පවත්වන ලද බාහිර විභාගවල ප්‍රතිඵල මාස 08 සිට 12 දක්වා කාල ප්‍රමාදයකින් නිකුත් කර තිබුණි. | සමහර විභාග පරීක්ෂකවරුන් ඔවුන්ගේ කාර්ය බහුලත්වය හේතුවෙන් නියමිත දිනට පසුව ලකුණු ඉදිරිපත් කළහ. තවද, නිතර ගංවතුර අනතුරු ඇඟවීම් සහ පසුව CEDPL | චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි නියමිත මාස තුන තුළ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කාර්යාලය නැවත සකස් කිරීම හේතුවෙන් ප්‍රතිඵල නියමිත කාලයේදී නිකුත් කිරීමට බාධා ඇති විය. | |
| (ii) | අංක 01/2024 හා 2024 ජනවාරි 29 දිනැති මුදල් චක්‍රලේඛ | අධ්‍යයන නිවාඩු බැඳුම්කර ගිවිසුමට අනුව, ඕනෑම උල්ලංඝනයක් සඳහා සාමාන්‍ය බරිත ණය අනුපාතිකයට (AWLR) පොලිය සමඟ බැඳුම්කර වටිනාකම අයකර ගැනීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන විට රු. 34,453,532 ක හිඟ බැඳුම්කර ශේෂය සඳහා පොලිය ලෙස රු. 4,134,423 ක් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | අයකර ගැනීම සිදුවෙමින් පවතී. පාරිතෝෂිත හෝ විශ්‍රාම වැටුප් අරමුදලෙන් නඩු දෙකක් සම්පූර්ණයෙන්ම පියවා ඇත. BRRC සහ කවුන්සිලයේ උපදෙස් අනුව හතරක් මාසික වාරික වශයෙන් ගෙවනු ලැබේ. එකක් ඇපකරුවන් විසින් පියවා ඇති අතර අනෙක මාසික ආපසු ගෙවීම යටතේ පවතී. පොලී අදාළත්වය තීරණය කිරීම සඳහා 2025 අගෝස්තු මාසයේදී BRRC රැස්වීමේදී සියලුම නඩු සමාලෝචනය කෙරේ. | චක්‍රලේඛයට අනුකූලව හිඟ බැඳුම්කර ශේෂයන් සඳහා පොලිය අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ii) | 2024 ජනවාරි 29 දිනැති අංක 01/2024 දරන මුල්‍ය චක්‍රලේඛය සහ අංක 03/2022 දරන අභ්‍යන්තර විගණන චක්‍රලේඛය | මාර්ගෝපදේශයන්ට අනුව, ඉල්ලා අස්වීමේ අවස්ථාවන්හිදී මාස 48ක් ඇතුළත සහ සේවයෙන් ඉවත්වන අවස්ථාවන්හිදී මාස 3ක් ඇතුළත බැඳුම්කර අයකර ගැනීම් සම්පූර්ණ කළ යුතු අතර, මාස 60 ඉක්මවන ආපසු ගෙවීමේ සැලසුම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය අවශ්‍ය වේ. කෙසේ වෙතත්, නියමිත විධිවිධානවලට පටහැනිව, භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන විශ්වවිද්‍යාලය වාරික 240ක් දක්වා අයකර ගැනීමේ සැලැස්මක් ක්‍රියාත්මක කර තිබුණි. | විශේෂිත අවස්ථාවන් (උදා: මූල්‍ය දුෂ්කරතා) මත පදනම්ව, BRRC සහ කවුන්සිලය විසින් තනි අපගමන අවස්ථා අනුමත කරන ලදී. අනාගතයේදී සියලුම අවස්ථාවන් චක්‍රලේඛ මාර්ගෝපදේශවලට දැඩි ලෙස අනුකූලව සිදු කරනු ඇත. | මූල්‍ය හා අභ්‍යන්තර විගණන චක්‍රලේඛවලට අනුකූලව නියමිත සීමාවන් ඉක්මවා යන අයකර ගැනීමේ සැලසුම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.151,280,866 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.52,534,712 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.98,746,154 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයට ප්‍රතිරූපීව රු.272,370,851 කින් මෙහෙයුම් වියදම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම සහ ස්වයං මූල්‍ය වැඩසටහන් වැනි ආදායම් ප්‍රභවයන්ගෙන් විශ්වවිද්‍යාලයේ ආදායම පිළිවෙලින් සියයට 14 කින් සහ සියයට 23 කින් අඩු වී ඇති අතර, පාරිතෝෂික වියදම් පෙර වසරට සාපේක්ෂව සියයට 245 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2005 දී බැඳුම්කර ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකුගෙන් රු.මිලියන 1.73 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර, 2013 දී එනම් වසර 9 ක ප්‍රමාදයකින් පසුව ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර තිබුණි. ඔහු නැවත පැමිණ වසර හයක් ඇතුළත අයකර ගැනීම සිදු නොවූ බැවින්, පසුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මුදල් ආපසු ගෙවීමට නියෝග කරන ලදී. මෙම රු.මිලියන 1.73 ක හිඟ මුදල් අහිමි වීම පරිපාලන නොසැලකිල්ල හේතුවෙන් සිදුවූවක් විය. 2017 දී කෝප් කමිටුව මගින් වගකිවයුත්තන්ගෙන් මුදල අයකර ගැනීමට නිර්දේශ කර තිබියදීත්, විශ්වවිද්‍යාල කවුන්සිලය වසර හතකට වැඩි කාලයක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාල කවුන්සිලය විසින් උප කමිටුවක් පත් කර ඇති අතර, එම වාර්තාව ඉක්මනින් සම්පූර්ණ කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. | 2017 කෝප් කමිටුව නිර්දේශය ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලය වහාම පියවර ගත යුතුය. |
| (ආ) නව ශාරීරික අධ්‍යාපන අධ්‍යක්ෂවරයෙකු රාජකාරි භාර ගන්නා විට, සියලු වත්කම් සහ ලේඛන ඉවත්ව යන අධ්‍යක්ෂවරයා විසින් විධිමත් ලෙස භාර දිය යුතුය. කෙසේ වෙතත්, සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව, 2023 දී වාර්තා කරන ලද රු.3,733,784 ක් වටිනා පරිභෝජන භාණ්ඩ වලින් රු.87,600 ක් වටිනා භාණ්ඩ පමණක් භාර දී ඇති අතර, රු.3,646,184 ක විෂමතාවයක් දක්නට ලැබුණු අතර එය සනාථ කළ හැකි ලියකියවිලි නොමැතිකම හේතුවෙන් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. තවද, රු.10,293,811 ක් වටිනා ස්ථාවර | අප විසින් ඉන්වෙන්ටරි ලේඛන සමීක්ෂණ මණ්ඩල වාර්තාව සමඟ සංසන්දනය කර ඇති අතර, සමහර අයිතම ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඇති බව සොයා ගෙන ඇත. හඳුනා නොගත් අයිතම සඳහා, භෞතිකව එම අයිතම සත්‍යාපනය කිරීමට සඳහා කමිටුවක් පත් කරනු ලබන අතර, සොයාගැනීම් වාර්තා කරනු ලැබේ. | විශ්වවිද්‍යාලය විසින් ස්ථාන මාරුවීමකදී විධිමත් භාරදීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතු අතර, වගවීම පවත්වා ගැනීමට සහ විෂමතා වැළැක්වීම සඳහා සියලුම වත්කම් ලේඛන නිසි ලෙස වාර්තා ගත කර සහ සත්‍යාපනය කර |

| | | |
|---|---|---|
| වත්කම් ද නව අධ්‍යක්ෂවරයාට භාර දී නොතිබුණි. | | පවත්වාගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 සහ 2024 අතර කාලය තුළ රු.9,375,155 ක් වටිනා CCTV පද්ධතියක් ස්ථාපනය කර තිබුණද, නිසි අධීක්ෂණ යාන්ත්‍රණයක් සහ මධ්‍යගත නිරීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අපේක්ෂිත ආරක්ෂක ප්‍රතිලාභ අත්කර ගැනීමට නොහැකි වී ඇති අතර ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. අධීක්ෂණය හෝ පද්ධති කළමනාකරණය සඳහා පැහැදිලි වගකීමක් නොමැතිව උපකරණ අලුත්වැඩියාවන් පමණක් ඉලෙක්ට්‍රොනික අලුත්වැඩියා සේවා ඒකකය විසින් හසුරුවනු ලබයි. | සීමිත අරමුදල්, කාර්ය මණ්ඩල හිඟය සහ අනෙකුත් ප්‍රමුඛතා හේතුවෙන් සම්පූර්ණ මධ්‍යම අධීක්ෂණ පද්ධතිය සහ ආරක්ෂක පියවරයන් සැකසීම ප්‍රමාද විය. CCTV පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා කැපවූ කාර්ය මණ්ඩලය පත් කිරීම, අරමුදල් වෙන් කිරීම සහ SOP සංවර්ධනය කිරීම මගින් ආරක්ෂාව වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර තිබේ. | CCTV පද්ධතිය ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් මධ්‍යගත නිරීක්ෂණ සහ අධීක්ෂණ පද්ධතියක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලය සාමාන්‍ය උපාධි සිසුන් සඳහා ශිෂ්‍යාධාර ප්‍රදාන වාරික 30 කින් ගෙවීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2024 අගෝස්තු සහ සැප්තැම්බර් සඳහා 31 වන සහ 32 වන වාරික ලෙස රු.2,520,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. රඳවා තබා ගැනීමෙන් රු.900,000 ක් අයකර ගත් අතර, ඉතිරි රු.1,620,000 විගණන දිනය වන 2025 ජුනි 17 වන විටත් අයකරගෙන නොතිබුණි. රු.1,620,000 ක් වැඩිපුර ගෙවීම හේතුවෙන්, 2024 දෙසැම්බර් මාසයේ 9.25% ක ස්ථාවර තැන්පතු අනුපාතය මත පදනම්ව, පසුගිය මාස හය තුළ විශ්වවිද්‍යාලයට රු.74,925 ක පොලී අලාභයක් සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 156(1) ට අනුව, එම අලාභය සඳහා වගකිවයුත්තන් හඳුනාගෙන අයකරගෙන නොතිබුණි. | සුභසාධන අංශය සිසුන් 4,800 කට අධික සංඛ්‍යාවක් සඳහා ශිෂ්‍යාධාර සහ මහපොළ ගෙවීම් අතින් සිදු කරන අතර, ප්‍රධාන වශයෙන් එක් නිලධාරියෙකු විසින් මෙය සිදු කරන අතර, පරිගණකගත පද්ධතියක් නොමැතිකම හේතුවෙන් ඉස්ලාමීය අධ්‍යයන හා අරාබි භාෂා පීඨයේ වැඩිපුර ගෙවීම් ගැටලුවක් ඇති විය. විශේෂ උපාධි නතර කළ සිසුන්ට වාරික 40ක් වෙනුවට වාරික 30කට වඩා ගෙවා ඇත. දෝෂය වහාම අනාවරණය වූ අතර, රු. 900,000 (70%) අයකර ගෙන ඇති අතර රු. 788,000ක් අයකර ගනිමින් පවතී. මෙම ගැටළුව නොදැනුවත්වම සිදු වී ඇති අතර, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග තුල වැඩ අඩු කිරීම සහ අතිරේක නිලධාරියෙකු පත් කිරීම ඇතුළත් වේ. | ඉතිරි ශේෂය සිසුන්ගෙන් හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට පියවර ගත යුතු අතර, පරිගණකගත ශිෂ්‍යාධාර අධීක්ෂණ පද්ධතියක් සමඟ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉංග්‍රීසි කථිකාචාර්යවරයෙකු බැඳුම්කර බැඳීම් දෙකක් එනම් නොර්තුම්බ්‍රියා විශ්ව විද්‍යාලයේ අසම්පූර්ණ ආචාර්ය උපාධියක් සඳහා බැඳුම්කර 01 යටතේ රු.2,802,746 ක් සහ මැලේසියාවේ උටාරා විශ්ව විද්‍යාලයේ අසම්පූර්ණ ආචාර්ය උපාධියක් සඳහා බැඳුම්කර 02 යටතේ රු.3,866,804 ක් පැහැර හැර ඇති අතර බැඳුම්කර 01 සම්පූර්ණයෙන් පියවීමට පෙර බැඳුම්කර 02 අනුමත කර ඇති බව නිරීක්ෂණය වූ අතර, එය විශ්ව විද්‍යාලයේ මූල්‍ය අධීක්ෂණයේ අඩුපාඩුවක් වන බව නිරීක්ෂණය වේ. | ඔහුගේ කාර්යයේ සංකීර්ණත්වය සහ අඛණ්ඩ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ඔහුගේ පළමු බැඳුම්කර බැඳීම තිබියදීත්, කථිකාචාර්යාගේ දෙවන බැඳුම්කරය (බැඳුම්කර 02) සඳහා කවුන්සිලය අනුමැතිය ලබා දී ඇත. | නිසි මූල්‍ය පාලනය සහ වගවීම සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාලය නව බැඳුම්කර අනුමත කළ යුත්තේ පවතින බැඳුම්කර සම්පූර්ණයෙන් පියවීමෙන් පසුව විය යුතුය. |

**3.4 නිෂ්ක්‍රීය හෝ ඌණ උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| AHEAD ව්‍යාපෘතිය යටතේ UBL කාර්යාලය සංවර්ධනය කිරීම සඳහා UBL ඒකකය වෙත රු.3,226,556 ක වත්කම් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, මිලදී ගත් අයිතම ඒවායේ අපේක්ෂිත අරමුණු සඳහා යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය. | UBL කාර්යාල ගෘහ භාණ්ඩ සියල්ල UBL ඉන්වෙන්ටරියේ ගිණුම්ගත කර ඇති අතර ඒවා අපේක්ෂිත පරිදි භාවිතා කෙරේ. AHEAD විගණන කණ්ඩායම ක්‍රියාකාරකම් ඡායාරූපවල ඇති සනාථ කළ හැකි සාක්ෂි සමඟ අයිතම සත්‍යාපනය කර ඇත. | වත්කම් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

**3.5 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 ජුනි 28 වන දින නිම කිරීමට උප ව්‍යාපෘති 19 ක් සඳහා 2021 මාර්තු 29 වන දින කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කරන ලද කෘෂි තාක්ෂණික උද්‍යානය - මල්වත්ත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2023 අගෝස්තු 31 දක්වා සිව් වතාවක් දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, 2023 සැප්තැම්බර් 01 වන විට උප ව්‍යාපෘති 7 ක් පමණක් නිම කර තිබුණි. දුර්වල ප්‍රගතිය හේතුවෙන්, රු.51,095,561 ක් ගෙවීම් කිරීමෙන් පසු දෙපාර්ශවයේ එකගතාවයෙන් කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කර තිබුණි. කොන්ත්‍රාත්කරුගේ ධාරිතාව නිසි ලෙස තක්සේරු කිරීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩ 19 න් 7 ක් පමණක් සම්පූර්ණ කර ඇති අතර, | උප ව්‍යාපෘති 19 කින් සමන්විත ඇග්‍රොටෙක් පාර්ක් - මල්වත්ත ව්‍යාපෘතිය 2021 මාර්තු මාසයේදී අඩුම මිල ලංසුකරු ලෙස කවිඳු බිල්ඩර්ස් වෙත ප්‍රදානය කරන ලදී. ආර්ථික අර්බුදය සහ කොන්ත්‍රාත්කරුගේ බංකොලොත්භාවය හේතුවෙන්, සීමිත ප්‍රගතියකින් පසුව කොන්ත්‍රාත්තුව අවසන් කරන ලද අතර, සම්පූර්ණ කරන ලද වැඩ සඳහා රුපියල් මිලියන 51 ක් ගෙවා ඇත. 2024 නොවැම්බර් මාසයේදී උප ව්‍යාපෘති හතක් නැවත ප්‍රදානය කරන ලද අතර, තවත් ව්‍යාපෘති පහක් විකල්ප අරමුදල් මගින් සම්පූර්ණ කෙරේ. | විශ්වවිද්‍යාලය විසින් කොන්ත්‍රාත්කරුවන්ගේ හැකියාවන් ඇගයීම, ව්‍යාපෘති අධීක්ෂණය ශක්තිමත් කිරීම, කාලෝචිතව පසු විපරම් සහතික කිරීම, ප්‍රමාදයන්, නාස්තිය වැළැක්වීමට සහ මුදලට වටිනාකමක් ලබා ගැනීමට උපකරණ සහ ද්‍රව්‍ය නිසි ලෙස භාවිතා කිරීම ආදිය නිසි සැලකිල්ලෙන් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 2024 නොවැම්බර් මාසයේදී වැඩ 7 ක් නැවත ප්‍රදානය කර තිබූ අතර රු.46,497,785 ක් වටිනා වැඩ 5 ක් සඳහා අතිරේක අරමුදල් අවශ්‍ය වී තිබුණි. තවද, රු.777,600 ක් වටිනා පාරජම්බුල කිරණ යෙදූ පොලිතීන් ආවරණයක් (UV-treated polythene covers) වැඩ සම්පූර්ණ නොවීම හේතුවෙන් මාස 6 කට වැඩි කාලයක් භාවිතයට නොගෙන තිබූ අතර, 2018 දී රු.290,000 කට මිලදී ගත් රෝද දෙකේ ට්‍රැක්ටරයක් සඳහා භ්‍රමණ ටිලර් ඇමිණුමක් (rotary tiller attachment) ලබා නොගැනීම හේතුවෙන් වසර 7 ක් පමණ නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. | හානියට පත් පොලිතීන් සඳහා රු.777,600 ක ගෙවීම අත්හිටුවන ලදී. ට්‍රැක්ටරය ප්‍රතිසංස්කරණය කිරීමට සහ භ්‍රමණ ටිලර් එකක් ලබා ගැනීමට ද දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී. | |
| (ආ) 30 kW සූර්ය පැනල පද්ධතියක් ඇතුළුව පවුල් සහ අවිවාහක නිල නිවාස ඉදිකිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් 2019 නොවැම්බර් 21 වන දින පිරිවැය රු.මිලියන 6 කට උප කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. සූර්ය පැනල සවිකිරීම සඳහා පිරිවැය ඇස්තමේන්තුවක් 2023 ජූලි 27 වන දින ලබා ගෙන තිබුණද, ලංකා විදුලි බල මණ්ඩල නිෂ්කාශනය ලබා ගෙන තිබුණේ 2025 අප්‍රේල් 17 වන දින වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මාස 21 ක් පමණ ප්‍රමාද වී තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන්, අපේක්ෂිත සූර්ය විදුලි ඒකකයක මිල 2024 ජුනි 30 වන දින සිට ඒකකයකට රු.37 සිට රු.27 දක්වා පහත වැටුණු අතර, එමඟින් මාස හයක් සඳහා ආසන්න වශයෙන් රු.768,456 ක සූර්ය බලශක්ති උත්පාදනයෙන් ලැබෙන ආදායම අහිමි වී තිබුණි. | ශුද්ධ මනුකරණය සඳහා ලංකා විදුලි බල මණ්ඩලයේ අවසරය 2025.04.17 දින ලබා දෙන ලද අතර, ගෙවීම් සිදු කර 2025.06.14 දින ගිවිසුම අත්සන් කරන ලද අතර, එය සූර්ය බලශක්ති උත්පාදනයේ ආරම්භය සනිටුහන් කරයි. පද්ධතිය මේ වනවිට ක්‍රියාත්මක වන අතර විදුලි බල ජාලයට දායක වේ. ගිවිසුම අවසන් කිරීම ප්‍රමාද වීමෙන් කිසිදු මූල්‍යමය අලාභයක් සිදු නොවී ඇත්තේ ගාස්තුව වසර 07ක් සඳහා ස්ථාවර කර ඇති බැවිනි. ආදායම ප්‍රමාද වීමක් මිස අඩු වීමක් සිදු නොවීය. | ආදායම් ප්‍රමාදයන් වැළැක්වීම සහ බලශක්ති හෝ යටිතල පහසුකම් ව්‍යාපෘතිවලින් කාලීනව ප්‍රතිලාභ සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාලය, ලංකා විදුලි බල මණ්ඩලයේ නිෂ්කාශනය වැනි කාලානුරූපී නියාමන අනුමැතීන් ලබා ගත යුතුය. |
| තවද, ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවෙන් ඉතිරි වූ රු.4,211,852 ක මුදලින්, මිල ගණන් කැඳවීම, ඇගයීම් සිදු කිරීම හෝ තාක්ෂණික කමිටු අනුමැතිය ලබා ගැනීමකින් තොරව එම කොන්ත්‍රාත්කරුගෙන්ම රු.3,957,250 ක් වටිනා ගෘහ භාණ්ඩ සෘජුවම මිලදී ගැනීමට යොදාගෙන තිබුණු අතර එමඟින් සම්මත ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි උල්ලංඝනය කර තිබුණි. | ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවෙන් ඉතිරි වූ රු.4,211,852 ක මුදලින්, කාර්ය මණ්ඩල නවාතැන් සඳහා රු.3,957,250 ක් වටිනා අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා භාවිතා කරන ලදී. කාලීනව බෙදා හැරීම සහතික කිරීම සහ කාර්ය මණ්ඩල අවශ්‍යතා සපුරාලීම සඳහා ඉංජිනේරු සහ තාක්ෂණික වටිනාකම් පිරිවිතර අනුගමනය කරමින්, කොන්ත්‍රාත් විෂය පථය තුළ, ප්‍රධාන කොන්ත්‍රාත්කරු හරහා ප්‍රසම්පාදනය සිදු කරන ලදී. | සියලුම ප්‍රසම්පාදන රජයේ සම්මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වන බවට විශ්වවිද්‍යාලය සහතික විය යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට, විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරු 527 කින් 411 ක් පුරවා තිබුණු අතර, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, ප්‍රධාන විනය පාලක සහ වෙනත් අය ඇතුළු ප්‍රධාන පුරප්පාඩු 116 ක් පුරවා නොතිබුණි. මෙම පුරප්පාඩු නොපිරවීම වගකීම් පැවරීමට බාධාවක් වී තිබුණු අතර අභ්‍යන්තර පාලන කටයුතු දුර්වල කර තිබුණි. | බඳවා ගැනීම් අත්හිටුවීම සහ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග, නායකත්ව වෙනස්කම්, මැතිවරණ සහ ආපදා තත්ත්වයන් හේතුවෙන් ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් පුරප්පාඩු පුරවා නොතිබුණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් බඳවා ගැනීම් 2025 ජුනි දක්වා දීර්ඝ කළද, පත්වීම් සඳහා ලකුණු ලබා දීමේ යෝජනා ක්‍රමයේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින අතර, අදාළ පුරප්පාඩු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත. | අනුමත අනධ්‍යයන සේවක සංඛ්‍යාවේ ප්‍රධාන පුරප්පාඩු පිරවීම සඳහා විශ්වවිද්‍යාලය කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩල තනතුරු 283 න්, සමාලෝචිත වර්ෂය අවසානයේ 209 ක් පමණක් පුරවා තිබුණු අතර, ප්‍රධාන වශයෙන් ඉංජිනේරු පීඨයේ පුරප්පාඩු 74 ක් ඉතිරි වී තිබුණි. මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ නියෝජ්‍ය පුස්තකාලයාධිපති වැනි ප්‍රධාන තනතුරු පුරප්පාඩුව පැවතීම නිසා ඉගැන්වීම, පර්යේෂණ සහ ශිෂ්‍ය අධීක්ෂණයට අහිතකර ලෙස බලපා තිබුණි. | රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 04/2022 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මාර්ගෝපදේශයන්ට අනුව, අත්‍යවශ්‍ය නොවන අවස්ථාවන්හිදී හා අදාළ බලධාරීන් විසින් විශේෂයෙන් අනුමත නොකළ අවස්ථාවලදී බඳවා ගැනීම් අත්හිටුවා ඇති අතර 2023.11.20 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ලිපියට අනුව, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද පුරප්පාඩු පමණක් පිරවිය හැකි විය. විශ්ව විද්‍යාලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ඉල්ලා ඇති අතර අනුමත වූ පසු බඳවා ගැනීම් සිදු කරනු ඇත. | අධ්‍යයන පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය කඩිනම් කිරීම සඳහා විශ්වවිද්‍යාලය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) සක්‍රියව පසු විපරම් කටයුතු සිදු කළ යුතුය. |